## භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය - 2014

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 18(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කාර්යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

කාර්යාංශයට අනුබද්ධිතව ශුද්ධ වත්කම් රු. 108,452,724 ක් වූ පරිපාලිත සමාගමකින් සියයට 66 ක හිමිකමක් කාර්යාංශයට තිබුණද එම සමාගමේ මූල්‍ය ප්‍රකාශන කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයක් ඉදිරිපත් කර නොතිබුණි.

#### 2.2.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01**

භූ කම්පන මාන කුළුණු ඉදිකිරීම් හා නඩත්තු කටයුතු සඳහා ඇමෙරිකාවේ විශ්ව විද්‍යාලයකින් 2000 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ලැබී තිබූ රු. 6,665,050 ක මුදල ඉදිරි වර්ෂය තුල නිරවුල් කළ නොහැකි වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් ලෙස දක්වා තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02**

සමාලෝචිත වර්ෂයේදී දේපළ පිරියත හා උපකරණ අත්පත්කර ගැනීමට හා කෙරීගෙන යන වැඩ වෙනුවෙන් වැයකර තිබුණු තථ්‍ය මුදල රු.29,616,552 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි රු.43,673,921 ක් ලෙස දක්වා තිබුණි. එසේම සමාලෝචිත වර්ෂය තුලදී කෙරීගෙන යන වැඩ ගිණුමෙන් ගොඩනැගිලි ගිණුමට මාරු කර තිබුණු රු.17,900,845 ක වටිනාකමින් සමාලෝචිත වර්ෂයේ කෙරීගෙන යන වැඩ සඳහා වැයකර තිබුණු රු. 3,843,476 ක මුදල අඩුකර රු.14,057,369 ක් කෙරීගෙන යන වැඩ වලින් මුදල් ලැබීමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි නිවැරදි නොවන ආකාරයට දක්වා තිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03**

ඉකුත් වර්ෂවලට අදාල ගිණුම්කරණ ප්‍රතිපත්ති ,ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් හා වැරදි හේතුවෙන් ඉකුත් කාලපරිච්ඡේදවලට අදාළව සිදුකරනු ලබන නිවැරදි කිරීම් සංසන්දනාත්මක තොරතුරු නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු අතර එම වැරදි නිවැරදි කිරීම් විස්තරාත්මක සටහන් මඟින් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතුය. නමුත් කාර්යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව සිදුකර තිබුණු රු.108,286,341 ක වැරදි නිවැරදි කිරීම් කර මූල්‍ය ප්‍රකාශනවල ඉකුත් වර්ෂයට අදාල සංසන්දනාත්මක තොරතුරු නැවත ප්‍රතිෂ්ඨාපනය කර තිබුණද ඒ පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල සටහනක් මඟින් හෙළිදරව් කර නොතිබුණි.

**(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07**

සමාලෝචිත වර්ෂයේදී රු.477,156,170 ක පිරිවැය වූ කාණ්ඩ 5 කට අයත් වත්කම් රු.535,099,270 කට ප්‍රත්‍යාගණනය කර තිබුණද ඒ සම්බන්ධයෙන් ප්‍රත්‍යාගණනය සිදුකළ දිනය, ස්වාධීන හා සුදුසුකම් ලත් තක්සේරුකරුවෙකු විසින් වත්කම් ප්‍රත්‍යාගණනය කළේද යන බව, වත්කම් ප්‍රත්‍යාගණනයේදී යොදාගත් විශේෂිත උපකල්පනයන් හා වත්කම්වල සාධාරණ අගය තීරණය කළ ආකාරය පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

**(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 09**

තොග පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් වඩා අඩු අගයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති බවට සඳහන් කර තිබුණද මූල්‍ය ප්‍රකාශනවල තොග අගය කිරීමේ පදනම අනාවරණය කර නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුව රාජ්‍ය භාග ලැබීම් ඊට අදාළ ගිවිසුම්වල නියමයන්ට අනුව උපචිත පදනම අනුව හඳුනාගත යුතු වුවත් කාර්යාංශය මේ සඳහා මුදල් පදනම භාවිතා කර තිබුණි.මේ සම්බන්ධව සිදුකළ නියැදි පරීක්ෂාවේදී නිකුත් කර තිබුණු බලපත්‍ර 1,400 ක් සඳහා ලැබිය යුතු රාජ්‍ය භාග මුදල් ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

### 2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබූ එකතුව රු.71,322,061 ක් වූ වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට පෙර වර්ෂ ගැලපීමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) යෝජිත අමාත්‍යාංශ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අමාත්‍යාංශයට ලබා දී තිබූ රු. 55,000,000 ක මුදල මහා භාණ්ඩාගාරයට කළ මුදල් ප්‍රේෂණය කිරීමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සේවක දිරිදීමනා මුදල්වලින් රු 1,300,910 ක් යොදවා ඇති කර තිබූ සේවක ආපදා අරමුදල කාර්යාංශයේ නමින් ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර තිබූ නමුත් අරමුදල හා ආයෝජනය ගිණුම්වලින් අත්හැර තිබුණි.

(ඈ) භූ කම්පන මාන කුළුණු සඳහා විදේශීය රටවලින් ලැබී තිබුණු උපකරණවල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. මෙම උපකරණ වෙනුවෙන් දරා තිබූ රු.6,542,303 ක රේගු ගාස්තු ඇතුළු අනෙකුත් වියදම් ආයෝජන ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිනි.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| | | රු | |
| (අ) | දිරිදීමනා ගෙවීම | 60,823,367 | දිරිදීමනා ගෙවීමට පදනම් කරගත් ව්‍යාපෘති ලාභය ගණනය කිරීමට අදාළ විස්තර සහ ආදායම් හා වියදම් උපලේඛණ |
| (ආ) | කාර්ය මණ්ඩල ප්‍රවාහන වියදම | 975,330 | ධාවන සටහන් පත්‍රිකා |
| (ඇ) | ගොඩනැගිලි කුලී ආදායම් | 1,080,000 | කුලී ගිවිසුම |

**2.3 නීති, රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 28 (1) වගන්තිය | ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් 2008 වර්ෂයේ සිට මුහුදු වැලි විකිණීමේ කටයුතු සිදුකරන නමුත් ඒ සඳහා කාර්යාංශයෙන් වෙළඳ බලපත්‍ර හා ප්‍රවාහන බලපත්‍ර ලබාගෙන නොතිබුණි. එම ආයතනය විසින් සකසන ලද ප්‍රවාහන බලපත්‍ර උපයෝගී කරගනිමින් වැලි ප්‍රවාහනය කිරීමට කටයුතු කර තිබුණු නමුත් කාර්යාංශය ඒ පිළිබඳ අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ආ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 11 වන කොටසේ 6(2) (අ) ඡේදය | නිළධාරියා විසින් අවසන්වරට ලැබූ වැටුපෙන් දින 14 කට සමාන මුදල සේවා කාලයෙන් ගුණ කිරීමෙන් ගෙවිය යුතු පාරිතෝෂික ගණනය කළ යුතු වුවද එයට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී දින 30 ක වැටුප සැලකිල්ලට ගෙන පාරිතෝෂික සඳහා වෙන් කිරීම් සිදු කර තිබුණි. ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ඇ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 14(1) වගන්තිය හා 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | මූල්‍ය ප්‍රකාශන කට්ටලය සමග වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඈ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | නියමිත අනුමැතිය ලබා නොගෙන රු.219,735,981 ක මුදලක් භාණ්ඩාගාර බිල්පත්වල හා රු.579,077,890 ක මුදලක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා අයදුම්පත් ලබාගෙන බලපත්‍ර නිකුත් කර නොතිබූ රු.149,117,003 ක රාජ්‍ය භාග අත්තිකාරම් මුදල්වලට හා 1993 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලයට අදාළ රු.81,290,903 ක්වූ බලපත්‍ර ගාස්තු මුදල්වලට අදාළව රු.23,980,451 ක එකතු කළ අගය මත බදු මුදලක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඊ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 104(2) | සමාලෝචිත වර්ෂයේදී කාර්යාංශයේ වාහන දෙකකට අනතුරු සිදු වී තිබූ නමුත් ඒ පිළිබඳ විගණකාධිපති වෙත වාර්තා කර නොතිබුණි. |
| (උ) | 1994 අප්‍රේල් 30 දිනැති අංක 30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | විදේශ ආධාර ලැබීම් විදේශ සම්පත් අධ්‍යක්ෂක ජනරාල් සහ විගණකාධිපති වෙත වාර්තා කළ යුතු වුවත් භූ කම්පනමාන කුළුණු වෙනුවෙන් ජර්මනියෙන් හා ඇමෙරිකාවෙන් ලැබී තිබූ උපකරණ හා මුදල් සම්බන්ධයෙන් එසේ සිදුකර නොතිබුණි. |
| (ඌ) | 2001 අගෝස්තු 07 දිනැති අංක 15/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 වගන්තිය | ගම්පහ ප්‍රාදේශීය කාර්යාලයේ සේවකයින්ගේ පැමිණීම් හා පිටවීම් ලකුණු කිරීම සඳහා 2013 වර්ෂයේ ජූලි මස සිට වාර්තා කරන දිනය දක්වා වේලා සටහන් යන්ත්‍රයක් භාවිතා කර නොතිබුණි. |
| (එ) | 2014 මාර්තු 31 දිනැති අංක 08/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 (අ) වගන්තිය | නියමිත සේවා පැය ගණන ආවරණය නොකර සේවා ස්ථානයෙන් පිට වී තිබුණු අවස්ථා නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. |
| (ඒ) | 2011 ජනවාරි 27 දිනැති අංක පීඊඩී 56 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | ඉදිරි 6 මාසයක කාලයක් සඳහා වන කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් මුදලක් තබාගෙන ඉතිරි සියලු අතිරික්ත මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවත් කාර්යාංශය විසින් එසේ සිදුකර නොතිබුණි. |
| (ඔ) | 2013 ජූනි 17 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 හි විධිවිධාන ප්‍රකාරව බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියක් සකස්කර අනුමත කරවාගෙන නොතිබූ අතර අනුමත කරන ලද ප්‍රතිව්‍යුහගතකරණ යෝජනාවද ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඕ) | 2013 ජූනි 28 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියකින් තොරව අනුමත කාර්යය මණ්ඩලයට අතිරේකව නව තනතුරු 02 ක් ඇති කර නිළධාරීන් දෙදෙනකු බඳවාගෙන තිබුණි.ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී වැටුප් ලෙස රු. 118,379 ක මුදලක් ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ක) | 1996 අගෝස්තු 02 දිනැති අංක පීඊ1/000/6 දරන මුදල් අමාත්‍යාංශයේ ලිපිය | භූ විදුම් හා ඛනිජ ගවේෂණ ව්‍යාපෘතිවල ශුද්ධ ඉපයුම්වලින් සියයට 50 ක් දක්වා දිරිදීමනා ගෙවීමට අනුමැතිය ලැබී තිබුණද ඊට පටහැනිව කාර්යාංශය විසින් සමාන්‍ය බලපත්‍ර වෙනුවෙන් සිදුකර තිබූ ක්ෂේත්‍ර පරීක්ෂණවලට අදාළ පරීක්ෂණ ගාස්තු ( Inspection charges),පරීක්ෂණ පිපුරුම් ගාස්තු ( Test Blast charges ) හා රසායනාගාර ආදායම් සියල්ලම භූ විදුම් හා ඛනිජ ගවේෂණ ව්‍යාපෘතිවල ශුද්ධ ඉපයුම් ලෙස සලකා රු.60,823,367 ක මුදලක් අධිකාර බලයෙන් තොරව හා සාවද්‍ය ලෙස දිරිදීමනා ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්යාංශයේ මූල්‍ය ප්‍රතිඵලය බදු පෙර රු. මිලියන 842 ක ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ලාභය රු. මිලියන 624 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 218 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. රාජ්‍ය භාග ආදායම රු. මිලියන 453 කින් හා ව්‍යාපෘති ආදායම රු. මිලියන 9 කින් වැඩි වීම මෙම වර්ධනයට මූලිකව බලපා තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කැනීම් මත අයකළ සියයට 2 ක රාජ්‍ය භාග මුදල සියයට 4 දක්වා වැඩිකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ රාජ්‍ය භාග ආදායම රු මිලියන 453 කින් හෙවත් සියයට 66 කින් වර්ධනය වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව කාර්යාංශයේ මුළු වියදම සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 196 කින් එනම් සියයට 42 කින් වැඩි වී තිබුණි.කාර්යාංශයේ පරිපාලන වියදම රු. මිලියන 139 කින් හෙවත් සියයට 50 කින් සමාලෝචිත වර්ෂයේදි වැඩි වී තිබීම මෙම වියදම් වැඩිවීමට ප්‍රධාන හේතුව වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

කාර්යාංශයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව භූ විද්‍යා අංශය මගින් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු සමීක්ෂණවලට අදාල සිතියම් නිර්මාණය කිරීම, ඛනිජ සඳහා විශේෂ වාර්තා සැකසීම, රසායනාගාර වැඩි දියුණු කිරීම් හා පළාත් ඛනිජ සමීක්ෂණය ඇතුළු සැලසුම් කළ කාර්යයන් 40 ක ප්‍රගතිය සියයට 50 ක අඩු මට්ටමක පැවතුණි.

### 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

කාර්යාංශය විසින් කරනු ලබන ප්‍රධාන මෙහෙයුම් කටයුතු සම්බන්ධව සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රාජ්‍ය භාග මුදල් අයකිරීම :

(i) ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට මුහුදු වැලි කැනීම සඳහා නිකුත් කර තිබුණු බලපත්‍රයක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව අයවිය යුතු රු. 44,727,062 ක් වූ රාජ්‍ය භාග මුදල් හා ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු

කර නොතිබුණි. එසේම ඉකුත් වර්ෂවලට අදාලව නිකුත් කර තිබුණු බලපත්‍ර මත කැනීම් කර තිබුණු මුහුදු වැලි ඝන මීටර් 3,750,074 ක තොගයක් සඳහා අයවිය යුතු රු. මිලියන 100 කට අධික රාජ්‍ය භාග මුදල්ද අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව රු 1,133,601,622 ක මුදලක් රාජ්‍ය භාග මුදල් වශයෙන් එකතු කර තිබුණද භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණේ රු.650,000,000 ක මුදලක් පමණි.

(iii) කලු ගල් කැනීම් බලපත්‍ර සඳහා රාජ්‍ය භාග ගණනයේදී කාර්යාංශය විසින් පුපුරණ ද්‍රව්‍ය පාලකගෙන් ලබාගන්නා වාර්තා පදනම්කරගෙන ගණනය කිරීම් කර තිබුණි. මෙම ක්‍රමය තාර්කික හා ඵලදායී ක්‍රමයක් නොවන බවත් මේ හේතුවෙන් කලුගල් කැනීම් වෙනුවෙන් සැලකිය යුතු රාජ්‍ය භාග මුදලක් අහිමි වන බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

(iv) කාර්යාංශය විසින් ඛනිජ ද්‍රව්‍යවල වෙළඳපල වටිනාකම පදනම් කරගෙන රාජ්‍ය භාග ගණනය කළද 2011 වර්ෂයෙන් පසුව එම අගයන් සංශෝධනය කර නොතිබුණි.

(ආ) ගවේෂණ කටයුතු සඳහා විවිධ භූමි ප්‍රදේශ වෙන්කර දීම:

(i) 2003 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ගවේෂණ කටයුතු සඳහා භූමි නිදහස් කිරීමේ නිර්දේශයන් නොලැබූ අයදුම්පත් 96 කට අදාල රු 5,656,685 ක මුදල් ආපසු ගෙවීමේදී එම අයදුම්පත්වලට අදාලව වෙන්කර දී තිබූ භූමි ප්‍රදේශවල කිසිදු ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. තවද ගවේෂණ අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව අමාත්‍යාංශයට ඉදිරිපත්කර තිබූ අභියාචනා අමාත්‍යාංශය විසින් ප්‍රතික්ෂේප කර තිබියදී නව අයදුම්පත් 15 ක් නිර්දේශයන් නොමැතිව භාරගෙන තිබුණි.

(ii) ඉහත පරිදි කාර්යාංශය මඟින් විශේෂයෙන් වෙරළ ආශ්‍රිතව ගවේෂණ කටයුතු සඳහා ඉඩම් වෙන්කර දී තිබුණද ගවේෂණ කටයුතුවල ප්‍රගති වාර්තා හෝ සොයාගත් ඛනිජ සම්පත් සම්බන්ධ වාර්තා ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. ගවේෂණ කටයුතු අවසානයේ කැනීම් බලපත්‍ර ලබා ගත යුතු වුවත් එවැන්නක්ද සිදු වී නොතිබුණි. කාර්යාංශය මෙලෙස ඉඩම් වෙන්කර දීමෙන් අනවසර කැනීම් සිදුවීමේ වැඩි අවදානමක් පැවතියද මේ සම්බන්ධයෙන් කිසිදු පසු විපරමක් සිදු කර නොතිබුණි.

(ඇ) බලපත්‍ර නිකුත් කිරීම හා ගාස්තු අයකිරීම :

(i) බලපත්‍රයක් නිකුත්කිරීමට පෙර සපුරාලිය යුතු අවශ්‍යතා අසම්පූර්ණව තිබියදී කාර්යාංශය විසින් අයදුම්පත සමඟ සම්පූර්ණ බලපත්‍ර ගාස්තුවත් ඊට අදාළ එකතුකළ අගය මත බද්ද හා මුද්දර ගාස්තුවද අයකර තිබුණි.මීට අමතරව 2006 වර්ෂයේ සිට බලපත්‍රය මඟින් කැනීම් කරන ඛනිජ ප්‍රමාණය මත අයකළ යුතු රාජ්‍ය භාග මුදල් සඳහා අත්තිකාරම් මුදලක්ද අයකර තිබුණි.නමුත් එකී රාජ්‍ය භාග අත්තිකාරම් සඳහා ගෙවීමට නියමිත එකතු කළ අගය මත බදු මුදල 2015 ජනවාරි වන විටත් අයදුම්කරුගෙන් අයකර නොතිබුණි.

(ii) නීතිවිරෝධී කැනීම් පාලනය සඳහා කාර්යාංශය විසින් වැටලීම් ඒකකයක් ස්ථාපිත කර නොතිබීම නිසා දීප ව්‍යාප්තව නිරන්තරයෙන් අනවසර කැනීම් සිදුවුවත් ඒ සඳහා නීත්‍යානුකූලව කටයුතු කිරීමට අපොහොසත් වී තිබුණි.

(iii) කැනීම් සිදුකිරීමට පෙර මධ්‍යම පරිසර අධිකාරිය මඟින් නිකුත් කරන පාරිසරික නිරවුල් සහතික ලබාගත යුතු වුවද බොහොමයක් බලපත්‍ර ලබා දීමේදී මෙකී පාරිසරික නිරවුල් සහතික නොමැතිව බලපත්‍ර නිකුත්කර තිබුණි.

(ඇ) රසායනාගාර උපකරණ පාලනය :

(i) රසායනාගාරය තුළ පවතින ග්‍රෑම් 1,491 ක බරැති ප්ලැටිනම් උපකරණ ධාරිතාවය හා බර අනුව වර්ග කර නොතිබූ අතර ඉන්වෙන්ට්‍රි ලේඛනද යාවත්කාලීන කර නොතිබුණි. උක්ත ප්ලැටිනම්වල පිරිසිදුභාවය හා වටිනාකම් ස්වාධීන ආයතනයකින් තහවුරු කර නොගෙන කාර්යාංශයේ නිළධාරින් විසින්ම අගය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ii) භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ අයිතම් අංක 2064 යටතේ වූ අයිතම් තුනක් (50 cc dish) භෞතික පරීක්ෂාව සඳහා විගණනයට ඉදිරිපත් නොවීය .

(iii) භෞතික පරීක්ෂාවට ඉදිරිපත්කළ ග්‍රෑම් 102 ක ප්ලැටිනම් උපකරණ වර්ග පහක් ඉන්වෙන්ට්‍රි ගත කර නොතිබුණි.

(ඉ) මා ඔය, අත්තනගලු ඔය හා කැළණි ගඟ ආශ්‍රිතව වැලි හා මැටි කැනීම් සිදුකිරීමේදී බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කර පාරිසරික හානි සිදුවන අයුරින් කැනීම් කටයුතු සිදුකර තිබුණද ඒ පිළිබඳ සොයාබැලීමකින් තොරව බලපත්‍ර නිකුත් කිරීම හා අළුත් කිරීම සිදු කර තිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

කාර්යාංශය විසින් ආයතනයේ අරමුණුවලට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී රු. 1,786,640 ක මුදලක් විවිධ කටයුතු වෙනුවෙන් බාහිර ආයතන වෙත ගෙවා තිබුණි.

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 405 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 317 කි. ඒ අනුව පුරප්පාඩු 88 ක් පැවතුණි. මාණ්ඩලික නොවන හා සුළු සේවක පුරප්පාඩු පිළිවෙලින් 54 ක් හා 11 ක් පිරවීමට කටයුතු නොකර කොන්ත්‍රාත් පදනම මත පෞද්ගලික සමාගමකින් සේවකයින් බඳවාගෙන ගෙවීම් කර තිබුණි.

(ආ) නිළධාරීන් ප්‍රධාන කාර්යාලයෙහි අංශ අතරත් ප්‍රාදේශීය කාර්යාල අතරත් මාරු කිරීමේ පරිපාටියක් සකස් කර නොතිබීම නිසා ප්‍රාදේශීය කාර්යාලවල වසර 8 ක සිට වසර 14 ක් දක්වා දීර්ඝ කාලීනව සේවයේ යොදවා තිබුණි.

(ඇ) ගම්පහ ප්‍රාදේශීය කාර්යාලයේ නිළධාරීන්ගේ පැමිණීම හා පිටවීම සටහන් තැබීම සම්බන්ධයෙන් 2013 වර්ෂයේ ජූලි මාසයේදී හෙළිදරව් වූ අක්‍රමිකතාව සම්බන්ධව සිදුකරන පරීක්ෂණයේ වාර්තාව 2015 ජූලි වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

**4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

2011 වර්ෂයේදී කාර්යාංශයේ වාහන සඳහා සවිකර තිබූ ඉන්ධන සංවේදී හා දිශා මානක පද්ධතිය ගලවා ඉවත් කර තිබූ අතර එම උපකරණ මිලදීගැනීම සඳහා කාර්යාංශය වැය කර තිබූ මුදල රු. 2,880,000 ක් විය.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 ක්‍රියාකාරි සැලැස්ම**

2014 දෙසැම්බර් 17 දිනැති අංක 1/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් ඇතුලත් වාර්ෂික ක්‍රියාකාරී

සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් ඒ අනුව කැනීම් අංශයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණි.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදවාගෙන නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

**5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2013 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව 2015 මැයි මාසය වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ කාර්යාංශයේ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර කාර්යාංශයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) මානව සම්පත් කළමනාකරණය
(ආ) රාජ්‍ය භාග මුදල් අයකිරීම්
(ඇ) බලපත්‍ර නිකුත් කිරීම්
(ඈ) ඉන්වෙන්ට්‍රි පාලනය
(ඉ) කැනීම් කටයුතු
(ඊ) අයවැය පාලනය